# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1750 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 24/11/2024<br>පැය 1825 |


**ඔරුවක් පෙරලීමෙන් පුද්ගලයෙකු හා තරුණියක් අතුරුදහන් වීම - මීගමුව පොලිස් වසම.**

2024.11.24 වන අද දින දහවල් කාලයේ මීගමුව පොලිස් වසමේ මුන්නක්කරය සිරිවර්ධනපුර ප්‍රදේශයේදී කලපුවක පිරිසක් ගමන් කරමින් සිටි ඔරුවක් කලපුවේ නවතා තිබූ බෝට්ටුවක ගැටී ඔරුව පෙරලීමෙන් එහි ගමන් කරමින් සිටි හත් දෙනෙකු අතරින් පිරිමි පුද්ගලයෙකු හා තරුණියක් දියේ ගිලී අතුරුදහන්ව ඇත.

**අතුරුදහන් වූ පුද්ගලයා වයස අවුරුදු 50 ක් හා තරුණිය වයස අවුරුදු 18 ක් වන මීගමුව, සිරිවර්ධනපුර ප්‍රදේශයේ පදිංචි පියා සහ දියණිය වේ.**

අනතුරට පත් ඔරුවේ ගමන් කල පිරිස අතර එකම පවුලේ 05 දෙනෙකු, ක්‍රිස්තියානි පූජකවරයෙකු හා ඔරුවේ පැදිකරු වන අතර, මොවුන් කලපුවේ සවාරියක් යමින් සිටියදී මෙම අනතුරට පත්ව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. දියේගිලී බේරාගත් පිරිසෙන් වයස අවුරුදු 04ක ගැහැණු ළමයෙකු හා වයස අවුරුදු 59 ක් වන ඔරුව පැදවූ පුද්ගලයා මීගමුව රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී. අතුරුදහන් වූ අයවලුන් සොයා පොලිසිය හා නාවික හමුදා කිමිදුම්කරුවන් එක්ව මෙහෙයුමක් දියත් කර ඇත.

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**